# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1986 අංක 15 දරන සත්ව ආහාර පනත

[සහතිකය සටහන් කළේ 1986 ජූනි මස 20 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


1986 ජූනි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 1.20 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 15 දරන සත්ව ආහාර පනත

[සහතිකය සටහන් කළේ 1986 ජූනි මස 20 වන දින.]

එල්.ඩී.—ඕ. 66/79

**සත්ව ආහාර නිෂ්පාදනය කිරීම, විකිණීම සහ බෙදා හැරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 15 දරන සත්ව ආහාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මේ පනතේ කාර්ය සඳහා බලපත්‍ර දීමේ බලධරයා වන (මෙහි මින් මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව ආහාර රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතුය. **සත්ව ආහාර සඳහා බලපත්‍ර දීමේ බලධරයා.**

3. විකිණීම සඳහා වූ යම් සත්ව ආහාරයක් කිසිම තැනැත්තකු විසින් නිෂ්පාදනය කිරීම, ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කරනු නොලැබිය යුතු ය. **බලපත්‍ර දීම.**

4. (1) විකිණීම පිණිස යම් සත්ව ආහාරයක් නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින් ම, ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. **බලපත්‍රයක් ඉල්ලුම් කිරීම.**

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය ;

(ආ) සත්ව ආහාරය අලෙවි කරනු ලබන්නේ හෝ විකුණනු ලබන්නේ යම් යෝජිත වෙළෙඳ නාමයක් යටතේ ද ඒ යෝජිත වෙළෙඳ නාමය ;

(ඇ) ඒ සත්ව ආහාරය විකුණනු ලබන්නේ යම් බඳුනක ද, ඒ බඳුන මත අලවනු ලබන කෙටුම්පත් මුද්‍රිතයේ හෝ ලේබලයේ පිටපතක් ;

(ඈ) ඒ සත්ව ආහාරය යම් බඳුනක බහා විකුණනු ලබන්නේ නම් ඒ බඳුනේ සැම්පල ;

(ඉ) ඒ සත්ව ආහාරයේ සංයුතිය, එහි ශුද්ධ බර, ගබඩා කිරීමේ ස්ථායිතාව හා සත්ව ආහාරය පාවිච්චි කරනු ලැබිය හැකි කාල සීමාව ඉකුත්වන දිනය පිළිබඳ ප්‍රකාශයක් ; සහ

(ඊ) රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු.

5. (1) 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ඉල්ලීමක් ලැබීමෙන් පසුව රෙජිස්ට්‍රාර්වරයා ඒ ඉල්ලීමෙහි අඩංගු විස්තර සත්‍ය හා නිවැරදි බවට සෑහීමට පත්වුවහොත්, බලපත්‍රයක් නිකුත් කළ යුතුය. **බලපත්‍රය නිකුත් කිරීම.**

ඒ 087533—6,750 (85/12)

(2) බලපත්‍රයක් නිකුත් කිරීම, 15 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, බලපත්‍රයෙහි ප්‍රකාශිත කාලසීමාව සඳහා බලපැවැත් විය යුතු වන අතර, එය අළුත් කිරීම ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත කරනු ලැබිය හැකි විය යුතු ය.

(3) බලපත්‍රයක් අළුත් කිරීම සඳහා (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක පහත දැක්වෙන විස්තර අඩංගු විය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය;

(ආ) බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තර.

අනුමත කරන ලද සත්ව ආහාර.

6. (1) යම් සත්ව ආහාරයක්, එනම්,—

(අ) මේ පනතේ 5 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් මත විකිණීම සඳහා නිෂ්පාදනය කරන ලද; සහ

(ආ) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මත විකිණීම සඳහා ආනයනය කරන ලද,

යම් සත්ව ආහාරයක් (මෙහි මින් මතු "අනුමත කරන ලද සත්ව ආහාරයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුමත කරන ලද සත්ව ආහාරයක් බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද සත්ව ආහාරය සඳහා අංකයක් වෙන් කර දිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන සෑම ප්‍රකාශයක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු අතර එය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

අනුමත කරන ලද සත්ව ආහාර විකිණීම.

7. කිසිම තැනැත්තකු විසින් 6 වන වගන්තිය යටතේ ප්‍රකාශිත අනුමත කරන ලද සත්ව ආහාරයක් හැර, වෙනත් යම් සත්ව ආහාර යක් නොවිකුණනු ලැබිය යුතු ය.

සත්ව ආහාර උපදේශක කමිටුව.

8. (1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව ආහාර උපදේශක කමිටුවක් තිබිය යුතුය. තවද එය—

(අ) (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයාගෙන් හෝ එම අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන තැනැත්තකුගෙන්; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයින්ගෙන්, එනම්:—

(i) සත්ව ආහාර වෙළෙඳ අංශයේ නියෝජිතයකුගෙන්; සහ

(ii) සත්ව ආහාරවලට අදාළ කරුණු පිළිබඳ තාක්ෂණික දැනුම හා පළපුරුද්ද ඇති වෙනත් තැනැත්තන් තිදෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(3) කමිටුවේ සියළු රැස්වීම්වල මූලසුන අධ්‍යක්ෂවරයා පැමිණ සිටියහොත්, ඔහු විසින් දරනු ලැබිය යුතුය. ඒ රැස්වීමකට අධ්‍යක්ෂවරයා පැමිණ නොසිටි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමේ මූලසුන දරනු පිණිස, සාමාජිකයන්ගෙන් එක් අයකු තෝරාගනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා හැර සෑම සාමාජිකයකු ම, මරණය හෝ ඉල්ලා අස්වීම හෝ අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධූරය හිස් කරන්නේ නම් මිස, ඒ ධූරයට පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ධූරය දැරිය යුතු ය:

එසේ වුව ද, මිය යන හෝ ඉල්ලා අස්වන හෝ අන්‍යාකාරයෙන් ධූරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු, ධූරය කලින් හිස්කරන්නේ නම් මිස, ඔහුට පූර්වයෙන් වූ සාමාජිකයාගේ ධූර කාලයෙන් ශේෂවූ කාලසීමාව තුළ ධූරය දැරිය යුතුය.

(5) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින්, අධ්‍යක්ෂවරයා හැර වෙනත් යම් සාමාජිකයකු කිසිදු හේතුවක් නොදක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න නොකරනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂවරයා හැර, කාලය ඉකුත් වීම නිසා ධූරය හිස්කරන. වෙනත් යම් සාමාජිකයකු යළි පත්කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(7) අධ්‍යක්ෂවරයා හැර වෙනත් යම් සාමාජිකයකු, නොපැමිණීම හෝ අශක්‍යතාව නිසා යම් අවස්ථාවක තම ධූරයේ කාර්ය ඉටුකිරීමට අසමත් වේ නම්, ඒ කාලසීමාව තුළ දී ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව, ඒ සාමාජිකයා පත්කරනු ලැබූ ආකාරයට ම අමාත්‍යවරයා විසින්, වෙනත් යම් තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය.

(8) අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා ඒවා ගෙවනු ලබන ආකාරය, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකිය.

9. (අ) කමිටුව විසින්, පහත දැක්වෙන සියළු කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් රීති සෑදනු ලැබිය හැකි ය:— රීති.

(i) කමිටුවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය;

(ii) එහි කටයුතු කරගෙන යාම; සහ

(iii) එහි කර්තව්‍ය ඉටුකිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු;

(ආ) ඒ රීති කමිටුවේ සාමාජිකයන් සියළුදෙනාම පැමිණ සිටින රැස්වීමක දී සාදනු ලැබිය යුතු ය.

කමිටුවේ කර්තව්‍ය.

10. (i) සත්ව ආහාර සම්බන්ධයෙන් බලපත්‍ර දීම සහ සත්ව ආහාර විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හා පිළියෙල කිරීම සහ අනුමත කරන ලද සත්ව ආහාර විකිණීම සම්බන්ධයෙන් වූ යම් කරුණක් පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් දීම;

(ii) යම් අනුමත කරන ලද සත්ව ආහාරයක සංයුතිය, ශක්තිය, ගුණය හා පරිශුද්ධභාවය පිළිබඳ අවම ප්‍රමිති නියම කිරීම;

(iii) අනුමත කරන ලද සත්ව ආහාරවල ඉබදිය හැකි අනර්ථදායක හා නිෂ්ක්‍රිය ද්‍රව්‍යවල උපරිම මට්ටම නියම කිරීම;

(iv) සත්ව ආහාර ආනයනය කිරීම සහ අනුමත කරන ලද සත්ව ආහාර සහ සත්ව ආහාර මූල ද්‍රව්‍ය අපනයනය කිරීම සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳව ආනයන සහ අපනයන පාලකවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(v) අනුමත කරන ලද සත්ව ආහාර විශ්ලේෂණය කරනු ලැබිය යුතු ආකාරය නියම කිරීම; සහ

(vi) ඉහත කී කරුණුවලට සම්බන්ධ හෝ ආනුෂංගික වන්නා වූ නියම් කරනු ලැබිය හැකි වෙනත් පියවර ගැනීම

කමිටුවේ කර්තව්‍යයන් විය යුතු ය.

මුද්‍රිතයෙහි හෝ ලේබලයෙහි සඳහන් කළ යුතු විස්තර.

11. අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් විකුණනු ලබන්නේ යම් බඳුනක බහා ද ඒ බඳුන මත මුද්‍රිතයක් කර හෝ ලේබලයක් අලවා තිබිය යුතු අතර, ඒ මුද්‍රිතයෙහි හෝ ලේබලයෙහි පහත දැක්වෙන විස්තර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් තිබිය යුතු ය :—

(අ) අනුමත කරන ලද සත්ව ආහාරය විකුණනු ලබන්නේ කවර වෙළෙඳ නාමයක් යටතේ ද යන වග;

(ආ) අනුමත කරන ලද සත්ව ආහාරයේ වෙළෙඳ නාමය සඳහා යොදන ලද අකුරුවල ප්‍රමාණයෙන් අඩකට වඩා කුඩා නොවූ ප්‍රමාණයක අකුරුවලින් සහ වෙළෙඳ නාමය සමඟම ඊට පහළින් දැක්වෙන ඒ අනුමත කරන ලද සත්ව ආහාරයේ සක්‍රීය මිශ්‍රණ ද්‍රව්‍යවල පොදු නාම;

(ඇ) අනුමත කරන ලද සත්ව ආහාරයේ බර සියයට සියයක් සෑදී ඇති ආකාරය දැක්වෙන සේ එහි සංයුතිය පිළිබඳ ප්‍රකාශයක : තවද, එය ද්‍රව සංයෝගයක් වන අවස්ථාවක එහි සංයුතිය ප්‍රකාශ කිරීම ලීටරයක ග්‍රෑම් ප්‍රමාණය අනුව විය යුතුය ;

(ඈ) නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය ;

(ඉ) අනුමත කරන ලද සත්ව ආහාරය සරල ආහාරයක් ද නැත හොත් සංයෝජිත ආහාරයක් ද යන්න පිළිබඳ ප්‍රකාශයක් ;

(ඊ) සත්ව ආහාරය මේ පනත යටතේ අනුමත කරන ලද සත්ව ආහාරයක් ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති බව හඟවන ලාංඡනයක් විය යුතු "1986 සත්ව ආහාර පනත යටතේ අනුමත කරන ලද සත්ව ආහාරය" යන ප්‍රකාශය සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඊට වෙන් කර දෙන ලද බලපත්‍ර අංකය ;

(උ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර.

කමිටුව විසින් අධ්‍යයන හා විමර්ශන කිරීම හා වාර්තා කිරීම කළ යුතු බව.

**12.** කමිටුව විසින්, අනුමත කරන ලද සත්ව ආහාර සෑදීමට, නිෂ්පාදනය කිරීමට, සකස් කිරීමට, බෙදාහැරීමට හා විකිණීමට අදාළ වූ කරුණු අධ්‍යයනය කිරීම ද, සමාලෝචනයට භාජන කර තැබීම ද කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කලින් කලට අමාත්‍යවරයාට වාර්තා කළ යුතු ය. තවද, අනුමත කරන ලද සත්ව ආහාර පාලනය, අධීක්ෂණය, භාවිතය, අලෙවිකිරීම හා බෙදා හැරීම සඳහා ජාතික ආර්ථිකයේ හිත පිණිස අවශ්‍ය යයි හෝ සුදුසු යයි තමන් අදහස් කරන යෝජනා කමිටුව විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතුය.

අමාත්‍යවරයාගේ ඉල්ලීම මත කමිටුව විසින් වාර්තා ඉදිරිපත් කළ යුතු බව.

**13.** (1) කමිටුව විසින්, අමාත්‍යවරයාගේ ඉල්ලීම මත, අනුමත කරන ලද සත්ව ආහාර සෑදීමට, නිෂ්පාදනයට, සකස්කිරීමට බෙදාහැරීමට හා විකිණීමට අදාළ වූ යම් විශේෂ කරුණක් ගැන අධ්‍යයන පිළියෙළ කිරීම ද වාර්තා කිරීම ද කළ යුතු වන අතර, සුදුසුයයි කමිටුව සලකන වාර්තා හා නිර්දේශ ඉදිරිපත් කිරීම කමිටුවේ කාර්යය විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ තම කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී, කමිටුව විසින් තාක්ෂණික හා සංඛ්‍යා ලේඛන තොරතුරු හා උපදෙස් ලබා ගැනීමේ කාර්ය සඳහා යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් හෝ වෙනත් යම් ආයතනයකින් ආධාර ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, ඒ ආධාර දීම අවස්ථාවෝචිත පරිදි ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය සංස්ථාවේ හෝ වෙනත් ආයතනයේ කාර්යය විය යුතු ය.

අධ්‍යයන හා වාර්තා පළ කිරීම.

**14.** 12 වන වගන්තිය හා 13 වන වගන්තිය යටතේ කමිටුව විසින් සම්පාදනය කරනු ලබන අධ්‍යයන හා වාර්තා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පළකරනු ලැබිය හැකි ය. තව ද අමාත්‍යවරයා විසින්, උචිත යයි තමා සලකන අවස්ථාවක, ඒ අධ්‍යයන හා වාර්තා ක්‍රියාත්මක කරන ලෙස අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙනු ලැබිය හැකි ය.

බලපත්‍රය අවලංගු කිරීම.

**15.** (1) යම් තැනැත්තකු විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරනු ලබන අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් කමිටුවේ උපදෙස් ඇතිව 5 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම නියමයක් මගින් කරනු ලැබිය හැකිය.

(2) බලපත්‍රලාභියාට (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස ඔහුට දැන්වීමක් කිරීමෙන් පසුව හැර හා ඒ දැන්වීමෙහි නියම කරනු ලබන කාලසීමාව තුළ ඔහු හේතු දැක්වීමට අසමත්වීම හෝ ප්‍රමාණවත් හේතු නොදැක්වීම මත හැර එවැනි කිසිම නියමයක් නොකරනු ලැබිය යුතුය.

(3) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අවලංගු කරනු ලබන හෝ අත්හිටුවනු ලබන අවස්ථාවක ඒ බලපත්‍රලාභියා විසින් නිෂ්පාදනය කරන ලද ඒ සත්ව ආහාරය අනුමත කරන ලද සත්ව ආහාරයක් වීම අවසන් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම අවලංගු කිරීමක් හා අත්හිටුවීමක් ගැසට් පත්‍රයෙහි මෙන් ම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළවන පුවත්පත්වල ද පළකරනු ලබන නියමයක් මඟින් විය යුතු ය.

බඳුන හෝ සංයුතිය පිළිබඳ වෙනස් කිරීම.

16. යම් තැනැත්තකු විසින්, අනුමත කරන ලද යම් සත්ව ආහාරයක බඳුන, මුද්‍රිතය හෝ ලේබලය නැතහොත් සංයුතිය පිළිබඳ කිසිම වෙනස් කිරීමක්, ඒ සඳහා ඉල්ලීමක් කොට ඒ අපේක්ෂිත වෙනස් කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගෙන් පූර්ව අනුමතය ලබා ගෙන ඇත්නම් මිස, නොකරනු ලැබිය යුතුය.

අභියාචනා.

17. (1) 5 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ 15 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබීම හෝ අත්හිටුවනු ලැබීම හේතුකොටගෙන අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණය ඒ තැනැත්තාට දන්වනු ලැබීමෙන් දින හැටක් ඇතුළත, ඒ ප්‍රතික්ෂේප කිරීමට, අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විරුද්ධ අභියාචනයක් (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ලේකම්වරයා විසින්, තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී, ඒ අභියාචනය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකිය.

(2) අභියාචනයක් පිළිබඳව ලේකම්වරයාගේ තීරණය සියළු කාර්යයන් සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. තව ද ඒ තීරණය කවර වූ හෝ අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න නොකරනු ලැබිය යුතු ය.

අනුමත කරන ලද සත්ව ආහාර නිෂ්පාදනය කිරීම, විකිණීම සහ බෙදා හැරීම තහනම් කිරීම.

18. කිසිම තැනැත්තකු විසින්—

(අ) 10 වන වගන්තිය යටතේ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයට වඩා යම් ස්වාභාවික හෝ එක්කළ අනර්ථදායක දෙයක් හෝ නිෂ්ක්‍රිය ද්‍රව්‍යයක් ඇත්තා වූ අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් ;

(ආ) බාලකරනු ලැබූ හෝ වැරදි ලෙස සන්නාම් කරනු ලැබූ අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් ;

(ඇ) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග යක් කඩකරමින් හෝ උල්ලංඝනය කරමින් හෝ

විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම, පිළියෙළ කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

19. සෑම අනුමත කරන ලද සත්ව ආහාරයක්ම, එහි සංයුතිය, ශක්තිය, ගුණය සහ පරිශුද්ධභාවය මේ පනත යටතේ නියම කරන ලද සංයුතිය, ශක්තිය, ගුණය සහ පරිශුද්ධභාවය පිළිබඳ ප්‍රමිතියට අනුකූල නොවන්නේ නම් මේ පනතේ අර්ථය අනුව බාල කරනු ලැබ ඇති බව සලකනු ලැබිය යුතු ය. අනුමත කරන ලද සත්ව ආහාර බාලකොට ඇති බව සැලකීම.

20. අනුමත කරන ලද සත්ව ආහාරයක් :— අනුමත කරන ලද සත්ව ආහාරයක් වැරදි ලෙස සන්නාම් කොට ඇති බව සැලකීම.

(අ) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක යම් බඳුනක මුද්‍රිත යෙහි හෝ ලේබලයෙහි හෝ ඇසුරුමෙහි ඒ සත්ව ආහාර යේ සංයුතිය, ශක්තිය, ගුණය, පරිශුද්ධභාවය හෝ ආරක්ෂා සහිත බව සම්බන්ධයෙන් අසත්‍ය, නොමග යවන සුළු වංචනික හෝ වැරදි හැඟීමක් ඇති කිරීමට ඉඩ ඇති යම් ප්‍රකාශයක් සැලසුමක් හෝ උපක්‍රමයක් තිබේ නම් ;

(ආ) වෙනත් අනුමත කරන ලද සත්ව ආහාරයක් විකුණනු ලබන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන හෝ දක්වනු ලබන නාමය යටතේ ඒ සත්ව ආහාරය අනුකරණය කිරී මක් වේ නම් හෝ ඒ වෙනුවට ආදේශ කිරීමක් වේ නම් හෝ රුවවිලි සහගත විය හැකි ආකාරයකින් එයට සමාන වේ නම් නැතහොත් එහි නියම ස්වභාවය ඇක්වෙන පරිදි සරල ලෙස ලේබල් යොදා නැත්නම් හෝ පැහැදිලිව පෙනෙන සේ ලේබලය අලවා නොමැති නම් ;

(ඇ) ඇත්ත වශයෙන් එය නිෂ්පාදනය නොකෙරුණු ස්ථානයක හෝ රටක එය නිෂ්පාදනය කරනු ලැබූ බව ප්‍රකාශ කෙරේ නම් ;

(ඈ) වෙනත් අනුමත කරන ලද සත්ව ආහාරයක් විකුණනු ලබන නාමයක් යටතේ විකුණනු ලබන්නේ නම් හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ නම් ;

(ඉ) මේ පනතේ නියමයන්ට අනුකූලව මුද්‍රණය කිරීම හෝ ලේබල් කිරීම කර නැත් නම්

මේ පනතේ අර්ථය අනුව වැරදි ලෙස සන්නාම් කරනු ලැබ ඇති බව සලකනු ලැබිය යුතු ය.

අවම ප්‍රමිතිය පවත්වා ගත යුතු බව.

**21.** අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් සඳහා 10 වන වගන්තිය යටතේ අවම ප්‍රමිතියක් නියම කරනු ලබන අවස්ථාවක, කිසිම තැනැත්තකු විසින්, මේ පනතේ කාර්යය සඳහා කමිටුව විසින් නියම කරනු ලැබ ඇති ඒ අවම ප්‍රමිතියට අනුව ඒ අනුමත කරන ලද සත්ව ආහාරය ඇත්තේ නම් මිස, ඒ අනුමත කරන ලද සත්ව ආහාරය විකිණීම සඳහා නිෂ්පාදනය කිරීම හෝ විකිණීම හෝ ප්‍රචාරය කිරීම නොකරනු ලැබිය යුතු ය.

ප්‍රතිඥාහාරය.

**22.** (1) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක කිසිම නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දෙකු හෝ විසින්, ඒ සත්ව ආහාරයේ සංයුතිය, ශක්තිය, ගුණය හා පරිශුද්ධභාවය සම්බන්ධයෙන් ප්‍රතිඥාහාරයක් දෙනු ලබන්නේ නම් මිස, ඒ අනුමත කරන ලද සත්ව ආහාරය යම් තැනැත්තකුට නොවිකුණනු ලැබිය යුතු ය.

(2) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක යම් නිෂ්පාදකයකු, බෙදාහරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දකු හෝ විසින් අසත්‍ය, නොමග යවන සුළු හෝ වංචනික ප්‍රතිඥාහාරයක් දෙනු ලබන අවස්ථාවක, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

බලයලත් නිලධරයන් හා ඔවුන්ගේ කර්තව්‍ය.

**23.** (1) අධ්‍යක්ෂවරයා විසින්, මේ පනතේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පමණ තම දෙපාර්තමේන්තුවේ නිලධරයන් සංඛ්‍යාවක් නම් කරනු ලැබිය යුතු ය. තව ද, ඒ නිලධරයන් "බලයලත් නිලධරයන්" ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.

(2) බලයලත් නිලධරයකු විසින්—

(අ) යම් තැනැත්තකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ නියමයක් කඩ කරනු ලැබ තිබේදැයි නිශ්චය වශයෙන් දැන ගැනීම ;

(ආ) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක සැම්පල් විශ්ලේෂණය කිරීම සඳහා ඒ සත්ව ආහාරය විකිණීම පිණිස තම සන්තකයෙහි තබා ගන්නා වූ යම් තැනැත්තකුගෙන් ලබා ගැනීම ;

(ඇ) මේ පනත යටතේ බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට සම්බන්ධ හෝ අයත් වෙනත් සියළු ක්‍රියා හෝ දේවල්

කරනු ලැබිය හැකි ය.

(3) යම් බලයලත් නිලධරයකු විසින්, මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ තම කර්තව්‍ය ඉටුකිරීමේ දී දවසේ සියළු සාධාරණ වේලාවන්හි දී ඕනෑම පරිශ්‍රයකට ඇතුල් විය හැකි ය. එසේ ඇතුල්වීම හෝ මේ පනත හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් ප්‍රකාර තම බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටකිරීමට අවශ්‍ය වන්නා වූ, ඒ පරිශ්‍රය තුළ දී සද්භාවයෙන් ගනුව හරන ලද කිසිවක් සම්බන්ධයෙන් බලයලත් නිලධරයකු වගකීමකට යටත් නොවිය යුතු ය.

(4) ඒ පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ එය තුළ සිටින් නා වූ සෑම තැනැත්තකු විසින්, බලයලත් නිලධරයාට, මේ පනත යටතේ ඔහුගේ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමට හැකි වන පරිදි තමාගේ බලයෙ ඇතුළත වූ සියලු සාධාරණ ආධාර දීම ද, මේ පනත හා නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාධාරණ ලෙස ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි තොරතුරු ඔහුට සැපයීම ද කරනු ලැබිය යුතු ය.

(5) මේ පනත යටතේ තම කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේ බලය ලත් නිලධරයකුට බාධා කිරීම හෝ ඔහු රවටීම හෝ නොමඟ යැවීම කිසිදු තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

සැම්පල විශ්ලේෂණය කිරීම.

24. (1) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක නිර්වාහජත්වය පිළිබඳව සැක කිරීමට හේතු බලයලත් නිලධරයකුට ඇත්තා වූ ද ප්‍රශ්නයට භාජන වූ ඒ අනුමත කරන ලද සත්ව ආහාරය විශ්ලේෂණය කිරීම අවශ්‍ය වන බව ඔහුගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ඒ බලයලත් නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදකයා, ආනයනකරු හෝ විකුණන්නා හෝ ඒ නිෂ්පාදකයාගේ ආනයනකරුගේ හෝ විකුණන්නාගේ අනුයෝජිතයා ඉදිරිපිට දී, ඒ අනුමත කරන ලද සත්ව ආහාරයේ සැම්පලයක් ලබාගත යුතු අතර ඔහු විසින්—

(අ) ඒ සැම්පලය විශ්ලේෂණය කිරීම සඳහා ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බව, අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදකයාට, ආනයනකරුට හෝ විකුණන්නාට හෝ ඒ නිෂ්පාදකයාගේ, ආනයනකරුගේ හෝ විකුණන්නාගේ අනුයෝජිතයාට වහාම දන්වනු ලැබිය යුතුය ; තව ද

(ආ) ඒ සැම්පලය සමාන කොටස් තුනකට වහාම බෙදනු ලැබිය යුතු අතර, ඒ එක් එක් කොටස එහි ස්වභාවය අනුව කළ හැකි ආකාරයට වෙන් වශයෙන් ලකුණු කොට මුද්‍රා තබා, ඒ කොටස්වලින් එකක් අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදකයාට, ආනයනකරුට හෝ විකුණන්නාට නැතහොත් ඒ නිෂ්පාදකයාගේ, ආනයනකරුගේ හෝ විකුණන්නාගේ අනුයෝජිතයාට බාරදී ඉතිරි කොටස් බලයලත් විශ්ලේෂකයාට හා රෙජිස්ට්‍රාර්වරයාට බාර දෙනු ලැබිය යුතු ය.

(2) යම් විශ්ලේෂණයක ප්‍රතිඵලය සම්බන්ධයෙන් ආරාවුලක් පැන නැගී ඇති අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින්, තමා නම් කරන තීරක විශ්ලේෂකයකට තමා භාරයේ තිබෙන සැම්පලයේ කොටස ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ යම් නඩු පැවරීමක දී, මේ වගන්තිය යටතේ විශ්ලේෂණය සඳහා ලබා ගන්නා ලද යම් සැම්පලයක් සම්බන්ධයෙන් විශ්ලේෂකයකුගේ සහතිකය යයි අදහස් කරනු ලබන බලයලත් විශ්ලේෂකයකු හෝ තීරක විශ්ලේෂකයකු විසින් අත්සන් කරන ලද ලේඛනයක් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

රේගුවේ දී පරීක්ෂා කිරීම.

25. (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ අනුමත කරන ලද යම් සත්ව ආහාරයක ආනයනය පිළිබඳ රේගුවේ සටහන් පරීක්ෂා කිරීමේ හා ඒ අනුමත කරන ලද සත්ව ආහාරයෙන් සැම්පල ලබා ගෙන ඒවා පරීක්ෂා කොට වාර්තා කිරීම පිණිස තීරක විශ්ලේෂකට ඉදිරිපත් කිරීමේ අයිතිය, අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ විට, බලයලත් නිලධරයකුට තිබිය යුතු ය.

(2) සැම්පල ගෙන ඇති කවර වූ හෝ අවස්ථාවක දී ඒ අනුමත කරන ලද සත්ව ආහාරය, ගනු ලැබූ සැම්පලය ගැන තීරක විශ්ලේෂක විසින් වාර්තා කරනු ලබන තුරු, ආනයනකරුට හෝ බඩු භාර දෙන්නාට නිකුත් නොකරනු ලැබිය යුතු ය.

(3) අනුමත කරන ලද සත්ව ආහාරය 10 වන වගන්තිය යටතේ නියම කරන ලද අවම ප්‍රමිතියට අනුකූල නොවන බව තීරක විශ්ලේෂක විසින් වාර්තා කරනු ලැබුවහොත් අනුමත කරන ලද සත්ව ආහාරය සත්ව ආහාරයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළට ඇතුළු නොකරනු ලැබිය යුතු ය.

සැකයට භාජනය වූ අනුමත කරන ලද සත්ව ආහාර තහනම්ව තැබීම.

26. (1) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් මේ පනතේ නියමයන් උල්ලංඝනය කෙරෙමින් විකුණනු ලබන බව හෝ විකිණීම සඳහා තබනු ලබන බව නැතහොත් ඉදිරිපත් කරනු ලබන බව විශ්වාස කිරීමට තමාට හේතු තිබේ නම්, බලය ලත් නිලධරයකු විසින්, ඒ සත්ව ආහාරය තහනමට ගනු ලැබිය යුතු අතර, විශ්ලේෂණය කිරීම සඳහා තමා විසින් එයින් ගනු ලැබූ සැම්පලයක් පිළිබඳව වාර්තා කරනු ලබන තෙක් හා එය බැහැර කිරීම සඳහා වූ නියෝගයක් අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන තෙක්, තබාගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ අනුමත කරන ලද යම් සත්ව ආහාරයක්, බලයලත් නිලධරයාගේ මනාපය පරිදි, එය තහනමට ගනු ලැබුවේ යම් ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබීද ඒ ස්ථානයෙහි හෝ ගොඩනැගිල්ලෙහි තැබීම හෝ ගබඩා කිරීම හෝ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයකට ගෙනයාම හෝ කරනු ලැබිය හැකි ය.

ගාස්තු

27. (අ) යම් සත්ව ආහාරයක් සඳහා බලපත්‍ර ලබාගැනීම; හා

(ආ) බලපත්‍රයක් අලුත් කිරීම

සඳහා වන සෑම ඉල්ලීමක්ම නියම කරනු ලබන ගාස්තු සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

මේ පනත කඩ කිරීම සම්බන්ධයෙන් දඬුවම.

28. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන හෝ ඒ විධිවිධානවලට හෝ නියෝගවලට අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වූ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමෙන් පසු අවුරුදු දෙකක් නොඉක්මවන කාල සීමාවක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකින් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකින් හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ නිලධරයකු ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ තැනැත්තා, ඒ වරද කරනු ලැබුවේ තම දැනුම නොමැතිව බව හෝ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සැලකිල්ල දැක් වූ බව ඔප්පු කරයි නම්, ඔහු වරදකට වරදකරු ලෙස නොසලකනු ලැබිය යුතු ය.

29. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරන අධිකරණය විසින්, ඒ වරදට අධිකරණය විසින් නියම කළ හැකි යම් දඬුවමකට අනුපේක්ෂ වශයෙන්, වරද කරනු ලැබුවේ යම් දෙයක් හෝ දේවල් සම්බන්ධයෙන් ද ඒ දෙය හෝ දේවල් සියල්ල තහනමට ගෙන ජනරජය සතු කිරීමට ආඥා කරනු ලැබිය හැකි ය. රජය සතු කිරීම.

30. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග යටතේ සද්භාවයෙන් කරන ලද හෝ එසේ අදහස් කර කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුතු ය. සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

31. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දෙනු ලබන, අවශ්‍ය කෙරෙන හෝ නියම කෙරෙන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අනුමත කරන ලද සත්ව ආහාර වර්ග කිරීම හා අනුමත කරන ලද යම් සත්ව ආහාරයක සංයුතිය, ගුණය හා ස්වභාවය නියම කිරීම ;

(ආ) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් විකිණීම සඳහා මුද්‍රණය කිරීම, ලේබල් කිරීම, ඇසිරීම හා ප්‍රචාරණය කිරීම සඳහා ;

(ඇ) අනුමත කරන ලද සත්ව ආහාර පිළිබඳ ඇසුරුම්වල ප්‍රමාණ, මිණුම් හා වෙනත් පිරිවිතර ;

(ඈ) විකිණීම සඳහා වූ අනුමත කරන ලද සත්ව ආහාර පිළියෙල කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, නරක් නොවන සේ තබා ගැනීමේ, ඇසිරීමේ, ගබඩා කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රම ;

(ඉ) (i) බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කළ යුතු ආකාරය හා ක්‍රමය ;

(ii) බලපත්‍රයක් නිකුත් කිරීම හා අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ;

(ඊ) නිසි පරිදි මේ පනත බලාත්මක කිරීම හා පනතේ කාර්ය පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලබන තොරතුරු සපයන ලෙස සහ පොත් හා වාර්තා පවත්වාගෙන යන ලෙස අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් නිෂ්පාදනය කරන හෝ විකුණන තැනැත්තන්ට නියම කිරීම ;

(උ) මේ පනතේ කාර්ය සඳහා භාවිතා කළ යුතු ආකෘති ;

(ඌ) පරීක්ෂණය හා විශ්ලේෂණය සඳහා අවශ්‍ය කෙරෙන, අනුමත කරන ලද සත්ව ආහාර සැම්පල ගැනීම ;

(එ) නියම කළ යුතු යයි මේ පනතින් නියම කෙරෙන යම් කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීමේ දින දී හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) එසේ අනුමත නොකරන ලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, ඒ අනනුමතයේ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ බව සලකනු ලැබිය යුතු ය.

(6) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලැබූ බව සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සත්ව ආහාරය" යන්නෙන්, සතුන්ගේ හෝ කුකුළන්ගේ හෝ පෝෂණ අවශ්‍යතා මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් සැපයීම සඳහා වූ ද, උන්ගේ ආහාරය පිණිස දෙනු ලැබීමෙන් උන්ගේ පැවැත්මට, වර්ධනයට හා නිෂ්පාදන හැකියාවට උපකාරක වන්නාවූ ද යම් සරල හෝ සංයෝග කළ නිෂ්පාදනයක් අදහස් වන අතර ඊට ආහාර ආකලන ඇතුළත් වේ ;

" බලයලත් විශ්ලේෂක " යන්නෙන්, ආණ්ඩුවේ රස පරීක්ෂක වරයා හෝ සහකාර රස පරීක්ෂකවරයන් සහ අමාත්‍යවරයා විසින් බලයලත් විශ්ලේෂකයකු වශයෙන් ක්‍රියා කිරීමට ගැසට් පත්‍රයෙහි දැන්වීමකින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු අදහස් වේ ;

" සංයෝග කරන ලද ආහාර " යන්නෙන්, කුළු බඩු වර්ග හා විට මින් එකතු කරනු ලැබිය හැකි වන්නා වූ ද, අත්‍යවශ්‍ය පෝෂණ මූලද්‍රව්‍ය අඩංගු විය යුතු වූ ද, ආහාර ද්‍රව්‍ය දෙකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක මිශ්‍රණයකින් ලබා ගන්නා නිෂ්පාදනයක් අදහස් වේ ;

" ආනයනකරු " යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ විකිණීමේ හෝ සැපයීමේ කාර්ය සඳහා යම් සත්ව ආහාරයක් ආනයනය කරන යම් තැනැත්තකු අදහස් වේ ;

" නිෂ්පාදකයා " යන්නෙන්,—

(අ) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් සාදන ;

(ආ) අනුමත කරන ලද යම් සත්ව ආහාරයක් විකිණීම සඳහා සකස් කරන

යම් තැනැත්තකු අදහස් වේ ;

" නියම කරන ලද " යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරන ලද බව අදහස් වේ ;

" තීරක විශ්ලේෂක " යන්නෙන්, රෙජිස්ට්‍රාර්වරයා විසින් 24 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නම් කරනු ලබන විශ්ලේෂකයකු අදහස් වේ ;

" විකුණන්නා " යන්නෙන්, අනුමත කරන ලද යම් සත්ව ආහාර යක් සිල්ලරට විකිණීමේ කාර්ය සඳහා නිෂ්පාදකයා හෝ ආනයනකරු විසින් විකුණනු ලබන්නේ හෝ බාරදෙනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා අදහස් වේ ;

" සරල ආහාරය " යන්නෙන්, එකම ආහාර ද්‍රව්‍යයක් පමණක් අඩංගු ආහාරයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.